# කර්මාන්ත අමාත්‍යාංශය

# යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතික සඳහා රජයෙන් සහන

කර්මාන්ත අමාත්‍යාංශය විසින් දේශීය කර්මාන්තවල ඵලදායිතාවය ඉහල නැංවීම හා ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රහයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. මේ සඳහා 2024 ජනවාරි 01 දිනට වාර්ෂික පිරිවැටුම රු. මිලියන 350 ට අඩු සහ සේවක සංඛ්‍යාව 50 ට අඩු පහත සඳහන් සුළු කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා (GMP) තත්ත්ව සහතික ලබා ගැනීමට අයදුම් කළ හැකිය.

- සැකසූ ආහාර නිෂ්පාදන
- තේ ආශිත නිෂ්පාදන
- කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන
- කුළුබඩු නිෂ්පාදන
- පොල් ආශ්‍රිත නිෂ්පාදන
- ඇසුරුම් හා ආශ්‍රිත නිෂ්පාදන

**ප්‍රතිලාභ:**

- තෝරාගත් කර්මාන්ත සඳහා උපරිමය රු. 100,000/- දක්වා සහතිකපත් ගාස්තු ගෙවීම් කරන අතර සහතිකපත් සහ අදාල බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- වැඩසටහන ක්‍රියාත්මක කරන කාලය තුල අවශ්‍ය මගපෙන්වීම සිදු කරනු ලැබේ.

**යෝග්‍යතාවය:**

- අවම වශයෙන් අවු. 01 ක නිෂ්පාදන වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක විය යුතුය.
- අයදුම්පත් යොමු කරන අවස්ථාව වන විට අදාල සහතික ලබාගැනීම සඳහා සහතිකකරණ ආයතන වෙත අයදුම් නොකළ කර්මාන්තයක් විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රියාවලිය:**

- පුවත්පත් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසි මත සහ සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කර ගන්නා කරුණු මත ඉහත ක්ෂේත්‍රයන්ට අදාල නිෂ්පාදන කර්මාන්ත 80 ක් තෝරා ගැනීම සිදුකෙරේ.

**අනෙකුත් කොන්දේසි:**

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් (SLSI) හෝ ශ්‍රී ලංකා ප්‍රතීතකරණ මණ්ඩලයේ (SLAB) ප්‍රතීතකරණය ලද සහතිකරණ ආයතනයකින් සහතිකපත් ලබා ගත යුතුය.
- සහතිකපත් සහ බිල්පත් 2024 නොවැම්බර් 08 දිනට හෝ එදිනට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අදාල සහතිකපත් ගාස්තු ප්‍රතිපූර්ණය කරගත යුතුය.
- අදාල කර්මාන්තය සහතිකකරණ ක්‍රියාවලිය සිදුවන කාලයතුල වෙනත් රජයේ ආයතනයකින් මෙයට සමාන ප්‍රතිලාභ ලබා නොගතයුතුය.
- තෝරා ගන්නා අයදුම්කරුවන් නියමිත දිනට ප්‍රථම තම ආයතනයේ සහතිකකරණ ක්‍රියාවලිය අවසන් කරන බවට අමාත්‍යාංශය සමග එකඟතා ගිවිසුමකට යටත් විය යුතුය.

**අයදුම් කිරීම:**

- පහත සඳහන් QR කේතය මගින් හෝ ගූගල් දිගුව මගින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024 ජූනි 20 දින හෝ ඊට පෙර ඉදිරිපත් කලයුතු ය.

**ලිපිනය:**

අධ්‍යක්ෂ, සංවර්ධන අංශ I, කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලු පාර, කොළඹ 03.

වැඩි විස්තර : දුරකතන අංක: 0112422319, 0112432750 ඇමතීමෙන් හෝ Email: developmentdivisiongmp@gmail.com මගින් හෝ Website : www.industry.gov.lk මඟින් ලබාගත හැක.

**ලේකම්**
**කර්මාන්ත අමාත්‍යාංශය**
**73/1, ගාලු පාර, කොළඹ 03**

**Google Link :** https://shorturl.at/t2sTY